# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1782/29 - 2012 ඔක්තෝබර් 31 වැනි බදාදා - 2012.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත - 134(1) වගන්තිය යටතේ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය යටතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2010 නොවැම්බර් මස 30 දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ දී සම්මත කරගෙන ඇති මෙහි උපලේඛනයේ සඳහන් යෝජනාවෙන් කියවෙන ප්‍රදේශය 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම මා විසින් අනුමත කළ බව නිවේදනය කරමි.

විරාජ් මර්වින් පෙරේරා,<br>
පළාත් පාලන සහකාර කොමසාරිස්,<br>
පොළොන්නරුව දිස්ත්‍රික්කය.

2012 ඔක්තෝබර් මස 24 වැනි දින,<br>
පොළොන්නරුවේ දී ය.

උපලේඛනය

*යෝජනාව* :-

32. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියට අනුකූලව ලංකාපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත විස්තර කර ඇති තල්පොත නගරය නම් වූ,

*උතුරින්* :- පොළොන්නරුව සිංහපුර මාර්ගයේ 317 හන්දියෙන් පටන්ගෙන සෝමසිරි වෙළෙඳසල දක්වා (මධ්‍යම රේඛාවේ සිට බටහිර දෙසට මීටර් 100 ක් අයත් වන ලෙස) ගොස් එතැන් සිට හිඟුරක්ගොඩට යන අතුරු මාර්ගය දක්වා (උතුරු දෙසට මීටර් 100 ක් අයත් වන ලෙස) ගොස් එතැන් සිට වැලි ඇළ මාර්ගය දිගේ අංක 141 හා 151 හරහා යන පටු මාර්ගය ගමන් ගන්නා ස්ථානය දක්වා (බටහිර දෙසට මීටර් 100 ක් අයත් වන ලෙස) අයත් වන මායිමයි.


*නැගෙනහිරින්* .- 316 හන්දිය අසල පොළොන්නරුව සිංහපුර මාර්ගය දිගේ ප්‍රාදේශීය සභා නාම පුවරුව අසලින් 317 හන්දිය දක්වා (මධ්‍ය රේඛාවේ සිට මීටර් 100 ක් නැගෙනහිරට අයත් වන ලෙස) අයත් වන මායිමයි.

1A - PG 001426— 335 (2012/11)

*දකුණින්* .- කලුවරගස් හන්දියෙන් පටන් ගෙන සතිපොළ අසලින් යන ප්‍රාදේශීය සභා මාර්ගය දිගේ පීරිස් කඩේ දක්වා ගොස් එතැන් සිට පොළොන්නරුව සිංහපුර මාර්ගය දිගේ 316 හන්දිය දක්වා (දකුණු දෙසට මීටර් 100 ක් අයිතිවන ලෙස) අයත්වන මායිමයි.

*බටහිරින්* .- කලුවරගස් හන්දියේ සිට පොදු ළිඳ දක්වා වූ ප්‍රාදේශීය සභා මාර්ගය දිගේ (මධ්‍යම රේඛාවේ සිට බටහිර දෙසට මීටර් 100 ක් අයත් වන ලෙස ගොස් එතැන් සිට අංක 141 හා 151 ඉඩම හරහා යන පටු මාර්ගය පටන් ගන්නා ස්ථානය දක්වා (බටහිර දෙසට මීටර් 100 ක් අයත් වන ලෙස).

ආදී වශයෙන් වටවූ මායිම් සීමාවට ඇතුළත් වන හා PO/LP/2009/146 මිනින්දෝරු සැලැස්මෙන් දක්වන භූමි ප්‍රදේශය දියුණු ප්‍රදේශයක් බවට පත් කිරීමට 2010.11.30 දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. එම්. එස්. පී. බී. විජේකෝන් මහතා යෝජනා කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. එම්. එස්. පී. බී. විජේකෝන් මහතා විසින් ගෙන ආ අංක 32 දරන යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. විජේතුංග මහතා විසින් ස්ථිර කරන ලදී. ඉන් අනතුරුව ගරු සභාපති මංජු ශ්‍රී අලුත්වත්ත මහතා විසින් සභාව විමසීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.




11-647